# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

REACHING NATIONS

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XVII　　JANUARY 2023　　Issue No. 02


## ශුද්ධවූ බයිබලය

**(මතෙව් 5:11-18)**

11. මනුෂ්‍යයන් මා නිසා නුඹලාට නින්දා පීඩාකොට නුඹලාට විරුද්ධව සියලු ආකාර අගුණ බොරුවෙන් කියන කල නුඹලා ආශිර්වාදලද්දෝය.

12. ප්‍රීතිවෙයල්ලා, ඉතා සන්තෝෂවෙයල්ලා, මක්නිසාද ස්වර්ගයෙහි නුඹලාගේ විපාකය මහත්. නුඹලාට පළමුවෙන් සිටි අනාගතවක්තෘන්වරුන්ටත් ඔව්හු එලෙසම පීඩාකලෝය.

13. නුඹලා පොළොවේ ලුණුය. නමුත් ලුණුවල රස නැතිවුණොත් ඒවා කුමකින් රසකරනු ලබන්නේද? එතැන පටන් ඒවා පිටත දමනු ලබන්ටද මනුෂ්‍යයන්ගේ පයින් පාගනු ලබන්ටද මිස අන් කිසිවකට නොවටනේය.

14. නුඹලා ලෝකයේ ආලෝකයය, කන්දක් මුදුනෙහි තිබෙන නුවරක් සඟවන්ට නොහැකිය.

15. මනුෂ්‍යයෝ පහනක් දල්වා කුරුණිය යට නොව පහන්රුක උඩ තබති. එවිට එයින් ගෙයි සිටින සියල්ලන් කෙරෙහි ආලෝකය බබළයි.

16. එසේම මනුෂ්‍යයන් විසින් නුඹලාගේ යහපත් ක්‍රියා දැක ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේට ගෞරව කරන පිණිස නුඹලාගේ ආලෝකය ඔවුන් ඉදිරියේ බබළාවා.

17. ව්‍යවස්ථාව නෝ අනාගතවාක්‍යය හෝ අවලංගුකරන පිණිස මම ආවේමියි නොසිතල්ලා, සම්පූර්ණකරන්ට මිස අවලංගුකරන්ට නාවෙමි.

18. සැබෑවක් නුඹලාට කියමි, අහසත් පොළවත් පහව යන තෙක්, සියල්ල සිදුවන තුරු, ව්‍යවස්ථාවෙන් එක අකුරක්වත් බින්දුවක්වත් කිසිසේත් පහව නොයන්නේය.

## 2023 අසිරිමත් සුභ නව වසරක්...

**BLESSED NEW YEAR . . .2023**

*Dr. A. රිචඩ් සැමුවෙල් විසිනි.*

***''සියලු තිත්තකමත් කෝපයත් උදහසත් කෝලාහලත් අපහාසත් සියලු ක්‍රෝධත් නුඹලා කෙරෙන් පහකරනු ලැබේවා. නුඹලා එකිනෙකා කෙරෙහි ගුණවන්තව අනුකම්පා ඇතුව සිට, ක්‍රිස්තුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේ නුඹලාට කමාවුණ ලෙසම නුඹලාත් එකිනෙකට කමාවෙයල්ලා.''*** *(එපීස 4:31-32)*

සෑම වසරකම ආරම්භයේදී අප අලුත් යෝජනාවන් ගැන සිතමු. නමුත් ගෙවුන වසරේදී අප සැලසුම්කල යෝජනා කොපමණ දුරට ඉෂ්ඨ කලාද කියා අපි නොසිතමු. කෙනෙක් විහිලුවට පැවසූ කථාවක්, 'නව වසරේ යෝජනාවන් සාදන්නේ ඒවා කඩන පිණිසය'

නව වසරට ගන්නාවූ යෝජනාවන් කණ්ඩායමක් ලෙස ක්‍රියාත්මක කල යුතු දෙයකි. යේසුස්වහන්සේ විසින් පුහුණුකරනු ලැබුවාවූ උන්වහන්සේගේ ගෝලයින් උන්වහන්සේව කුරුසිපත් කරන විටදී උන්වහන්සේව අත්හැර දමා දිවුවේය. යේසුස්වහන්සේ මලවුන්ගෙන් නැගුටුන පසු උන්වහන්සේගේ ගෝලයින් සියලු දෙනාටම ගලීලයේ කන්දෙහි රැස්වන ලෙසට පවසනු ලැබීය. ***(මතෙව් 26:16)*** ඔවුන් කීකරු වී එතැනට ගියමුත් ප්‍රමාදයක් ඇති නිසා ගෝලයින් නැවත ඔවුන්ගේ මසුන් අල්ලන්නාවූ රැකියාවට ගියේය. අපගේ ආත්මික ගමන අප ආරම්භ කල යුත්තේ දෙවියන්වහන්සේ පිළිබඳ ඉතා හොඳ අවබෝධයක් හා අප කෙරෙහි ඇති උන්වහන්සේගේ සැලසුම් කුමක්ද කියා දැනගෙනය. එසේ කලහොත්

3 වෙනි පිටුවට ...




**Echo of His Call**

*YouTube Christian Channel !*

5 minutes messages!!

**English & Hindi**

Every day – 4.00 A.M.

**Tamil & Telugu**

Monday to Saturday – 5.00 A.M.

Tamil Sunday Service – 8.30 A.M.


**You will get an opportunity to pray with Pr. S. Sam Selva Raj!**

Malayalam messages are under proposal & prayer!! Please pray.

ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

REACHING NATIONS

## from your dearly beloved brother...



# කැඳවීමේ ප්‍රතිරාවය



**"... නුඹේ බලාපොරොත්තුවද සිඳදමනු නොලැබේ..." (හිතෝපදේශ 23:18)**

### OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

CHIEF EDITOR
Angeline Selvakumari Henry, M.A., M.Ed.
MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
ADMINISTRATION
Bro. N. Prakasam, M.A., General Manager
EDITORIAL BOARD
Sis. Jesy Veena Sam
Sis. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Dr. A. Richard Samuel, M.A., Ph.D.
Rev. Dr. K.R. Rajasekaran
EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 95661 31858
CORE LEADERS
Bro. K. Puratchivendan
Bro. A. Edward Durai
Bro. A. Alvin
Bro. K. Abraham
Sis. Dhanalakshmi Chinnaiah
E.mail ID
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com
YOUTUBE CHANNEL
Echo of His Call

**ප්‍රේමණීය මිත්‍රයෙනි, අපගේ ස්වාමිවූ විශ්වයේ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ බලවත් නාමයෙන් ඔබට සුභ පැතුම් ගෙනෙමි.**

ප්‍රේමණීය සහෝදරයා සහෝදරිය, අපි ඔබ සැමදෙනාටම 2023 සුභ නව වසරක් වේවාය කියා යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් සුභපතමි. පසුගිය වසර මුළුල්ලේම අපට මඟපෙන්වමින් ආශිර්වාද කලාවූ අපගේ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේට සියලු ගෞරවය, මහිමය හා ස්තුතිය පුද කරමු.

ඔබ සැමදෙනාට කොහොමද? අපගේ හදවතේ ඉතා උනන්දුවක් හා බරක් ඇතිව ඔබ වෙනුවෙන් ඔබගේ පවුල වෙනුවෙන් හා ඔබගේ අවශ්‍යතාවයන් වෙනුවෙන් අපි යාච්ඤා කරමු. අපගේ සහකරුවන් ඇදහිල්ලෙන් අපට උපකාර කරන්නාවූ අය ශුභාරංචි ප්‍රකාශකයින් යන මේ සැම දෙනා ගැනම අප වෙන වෙනම පුද්ගලික ලෙස සටහන් තබමින් ඔබ සියලුදෙනාම වෙනුවෙන් වගකීමකින් යුතුව යාච්ඤා කරමු. අපට ඇති යාච්ඤා කාමරයෙහි පැය 24 පුරාම අප මේ සැමදෙනා වෙනුවෙන්ම යාච්ඤා කරමු. ස්වාමීන්වහන්සේ අපගේ යාච්ඤාවට පිළිතුරු දෙමින් ඔබට ආශිර්වාද කරනු ඇත. කිසි දෙයකට භිය නොවන්න. ස්වාමීන්වහන්සේ අප හා සමඟ සිටිති. දෙවියන්වහන්සේගේ දරුවන් මුහුණ දෙන්නාවූ සැම ආමරුකම්, ප්‍රශ්න හා කරදර ගැන අපි දනිමු. ධෛර්‍යමත් වෙන්න. මේ නව වසරේදී ස්වාමීන්වහන්සේ ඔබට මහත් දේ කරන සේක. *"එම්බා දේශය භය නොවී, ප්‍රීතිසන්තෝෂවෙයන්න, මක්නිසාද ස්වාමීන්වහන්සේ මහත් දේ කළසේක." (යෝවෙල් 2:21)*

අප ස්වාධීනව, සේවය කරන්නාවූ දේව දාසයින් හා සභාවන් ගැන තොරතුරු ලැබී ඇත. ඉදිරි කාලයේදී මෙවැනි අපට ඉන්දියාව තුළ බොහෝ අසීරු කාලයන්ට මුහුණදීමට සිදුවෙනු ඇත. එම නිසා සැම දේව දාසයෙක්ම ඉතා අවධානයෙන් යුතුව සිටිමින් අවශ්‍ය වන්නේ කුමක්ද කියා ප්‍රඥාවන්තව සොයා බලා සේවය කල යුතුය.

ඔබ ස්වාධීනව සේවය කරනවා නම්, ඔබගේ සේවය කිසි ආයතනයක් යටතේ නොමැතිනම් ඔබ ඉතාම අවධානම් තත්වයක සිටී. ඔබ ඔබගේ සේවය කවුරුන් හෝ පිළිගත් සංවිධානයක් යටතට යන්න. ඔබ යම් සංවිධානයකින් ඉවත්වී සිටීනම් එම අමනාපකම් ඉවත්කොට නැවත එම සංවිධානය යටතට එන්න. ඔබතුල තිබෙන සියලු භේදකම් ඉවත්කොට එකමුතුව වැඩ කරන්න. එසේ ඔබගේ අසල්වාසීන් කුමන ආගමක සිටියත් ඔවුන් සමඟ ඉතා හොඳ මිත්‍රත්වයක් ඇතිකරගන්න. මේ නත්තල් සමයේදී ඔබට හැකි ලෙස ඔවුන්ට තෑගි දෙන්න. මේ යෝජනාවන් ආදරයෙන් පිලිගෙන ක්‍රියා කරන්න.

ඉදිරි කාලයේදී ඔබගේ සේවයට දෙවියන්වහන්සේගේ මඟපෙන්වීම හා මනුෂ්‍යන්ගේ දයාව අවශ්‍ය වනු ඇත. *"වෘකයන් මැදට බැටළුවන් මෙන් මම නුඹලා යවමි, එහෙයින් සර්පයන් මෙන් නුවණ ඇතිව පරවියන් මෙන් අහිංසකව සිටපල්ලා." (මතෙව් 10:16)* ඔබ යම්කිසි ප්‍රශ්න තුළින් යනවා නම්, අප ඉතා හොඳ නීතිඥයින්, ගණකාධිකාරීන් සහ බයිබල් විශාරදයින් සිටී. ඔවුන් ඔබට නොමිලයේ උපකාර කරනු ඇත.

Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) ☼ BIBLECOR - Postal Courses (3 languages) ☼ Online Courses ☼ Theological Correspondence Courses (2 languages) ☼ Church Planting ☼ Nehemiah Bible Colleges ☼ Gospel Printing Press ☼ Great Commission Partners ☼ St. Paul's Matriculation School ☼ Crusades ☼ Community Development

ඔබ පූර්ණකාලීන සේවකයෙකු නම්, ඔබට දේව ධර්ම උපාධියක් නොමැති නම් ඇදහිල්ලෙන් යුතුව දෙවියන්වහන්සේගේ සේවය කරනවා නම් දෙවියන්වහන්සේ කැඳවූ නිසා මෙම සේවය කරනවා නම්, ඔබට ආසන්නව තිබෙන්නාවූ හෝ වෙනත් බයිබල් විදුහලක ඔබගේ නම ලියා පදිංචි කර Online හරහා පාඩමක් අවසන්කර සහතිකයක් ලබා ගන්න. ඔබට කිසිම සහතිකයක් නොමැතිනම් කරුණාකර එය ලබා ගන්නා පිණිස ක්‍රියා කරන්න. මේ සඳහා ඔබට කිසිම මුදලක් ගෙවීම අවශ්‍ය නැති අතර ඔබට උපකාර කිරීමට අප නිතරම බැඳී සිටිමු. ***''බලව, සහෝදරයන් එකඟව වාසය කිරීම කොපමණ යහපත්ද, කොපමණ ප්‍රසන්නද.''*** ඔබට මේ සම්බන්ධව උදවු අවශ්‍ය නම්, අපට ලිපියකින් හෝ විද්‍යුත් තැපෑලෙන් දන්වන්න. ඔබට උපකාර කිරීමට අපට හැකිය. අප එකට සිටිමු. එකට ජයගමු.

දෙවියන්වහන්සේ අපට උපකාර කරන විට අප මේ නව වසරේදී බොහෝ ස්ථාන වලට ගොස් දේව දාසයින්ව ශක්තිමත් කිරීමට බලාපොරොත්තු වෙමු. දැන් සිටම අප උදෙසා යාච්ඤා කරන්න. දෙවියන්වහන්සේ ඉතා හොඳ නීරෝගිකමත් පවුලේ හොඳ සමාදානමත් වාතාවරණයක් ආර්ථිකමය ලෙස හොඳ තත්වයක් ඇතිකරන්න කියා යාච්ඤා කරන්න.

මේ වසරේ සිට කැඳවීමේ ප්‍රතිරාවය සේවාවන් අපගේ, YouTube හරහා සෑම ඉරුදිනකම උදෑසන 8.30 හා සෑම දිනකම උදෑසන 5.00 වද විකාශනය වේ. මේවා ඔබට නැරඹීමට හැකිය.



***Media Ministry***

අපගේ මාධ්‍ය සේවාවන්ට ස්ථිරවූ ආර්ථික උපකාරයක් නොමැත. අපගේ සපයන්නා නම්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේය. අපගේ මෙම සේවාවන්ට සහය දැක්වීමට ඔබටද පුළුවනි.

පසුගිය වසර 54 මුළුල්ලේම ස්වාමීන්වහන්සේ අපගේ දෑත් අල්ලාගෙන ගෙන ආවේය. ඔබ සෑම දෙනාටම දෙවියන්වහන්සේ නිරතුරුවම ඔබට ආශිර්වාද කරන සේක.

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක**

**පාස්ටර් සෑම් සෙල්වරාජ් සහ ඇලෙස්ත් සැම්සන් සෑම්**

(+91) 98412 71858 / 98410 71858,
E.mail : samselvaraj333@gmail.com

***1 පිටුවෙන්....***

එය අපගේ ජීවන ගමනට බලවත් ආශිර්වාදයක් වනු ඇත. එපීසයේ තිබූ සභාවට පාවුළුතුමා ඉතා පැහැදිලිව ලියනමින් පවසනුයේ, ඔවුන්ගේ ගමනේ තිබූ අනවශ්‍ය දේ ඉවත් කරන්නය කියාය. ***''සියලු තිත්තකමත් කෝපයත් උදහසත් කෝලාහලත් අපහාසත් සියලු ක්‍රෝධත් නුඹලා කෙරෙන් පහකරනු ලැබේවා. නුඹලා එකිනෙකා කෙරෙහි ගුණවන්තව අනුකම්පා ඇතුව සිට, ක්‍රිස්තුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේ නුඹලාට කමාවුණ ලෙසම නුඹලාත් එකිනෙකාට කමාවෙයල්ලා.'' (එපීස 4:31-32)*** තවද අපට අවශ්‍ය දේ පමණක් රැගෙන මේ ගමන යා යුතුය කියා පාවුළුතුමා පවසයි. අපගේ ගමනේදී අප නොගෙනා යුතු කාරණා 6 ක් පිළිබඳව පාවුලු තුමා සඳහන් කරයි.

1. **තිත්තකම**
2. **කෝපය**
3. **උදහස**
4. **කෝලාහලය**
5. **අපහාස**
6. **ක්‍රෝධය**

මේවා වෙනුවට අප අපගේ ජීවිත ගමන තුල රැගෙන යා යුතු කාරණා 3 ක් සඳහන් කරයි.

1. **ගුණවන්තකම**
2. **අනුකම්පාව**
3. **කමා කිරීම**

## (1). තිත්තකම

අපගේ ජීවිතයේ තිත්තකම නැමති හැඟීම ඉවතට දැමීම ඉතාම අසීරුවූ කාරණයකි. අපට වැරදි කල අය සමඟ සමගිවීමට තිත්තකම විශාලවූ බාධාවකි. අපගේ ජීවිතයට සිදුවූ තුවාල හා වේදනාවන් අමතක නොකර අන් අය සමඟ එකට සිටීමට තිත්තකම විශාල බාධාවකි. තිත්තකම පිළිකාවක් මෙන් අපගේ මුළු ජීවිතය පුරාම පැතිරී ගොස් අපගේ මනස තුල රැඳී ඇති සතුට හා සාමය මරා දමනු ලබයි. මෙවැනි තිත්තකමේ බර අපගේ හදවත තුළ උසුලාගෙන යන විටදී අපගේ ආත්මික ගමන ඉදිරියට යාමටද ඉතා අසීරුවනු ඇත.

## (2). කෝපය

අප තුළ තිබෙන්නාවූ කෝපය ගින්නක් හා සමානය. එම ගින්න ක්ෂණිකවම පත්තුවී ඉහළට නගින්නේය. අපට ඉක්මන් කෝපය පැමිණෙන විටදී අප ආවේගයෙන් යුතුව කෑගසනු අතර වෙන අය වැරදි නම් අපි ඔවුන්ටද කෑ ගසමින් බැණ වදිනු ඇත. කෝපයෙන් ක්‍රියා කරනු ඇත.

නමුත් කිතුණුවන් මෙයට හාත්පසින්ම වෙනස් විය යුතුමය. දිනක් ජෝන් නැමති සහෝදරයෙක් ඉරුදින

*6 වෙනි පිටුවට....*

සභාව වෙත කාරයෙන් යන විටදී මාර්ගයෙහි වාහන තදබදය අධිකව තිබුණි. ජෝන්ට පිටුපසින් පැමිණි කාරයේ සිටි පුද්ගලයා ඔහුට වාහනය ඉස්සර කිරීමට නිසා වාහනයේ නලාව ඉතා ශබ්ධයෙන් නාද කරමින් සිටියේය. නමුත් එම වාහනය ඉස්සරහ කිරීමට ඉඩ දෙන පිණිස අගලකවත් ප්‍රමාණයක් නොතිබුණි. නමුත් ටික වේලාවකින් පසුව පසුපස පැමිණි වාහනය ඔහුව පසුකරමින් යන අතර ඔහුට ඉතා අසභ්‍ය වචන වලින්ද බැන වැදුනේය. මේ මොහොතේදී ජෝන්ට තරහාවක් පැමිණි නමුත් ඔහු එම කෝපය මැඩපවත්වාගෙන දේවස්ථානය වෙතට ගියේය. ඔහුගේ වාහනය දේවස්ථානයට ඇතුළු වූ විටදී පෙර ඔහුට පරුෂ වචනයෙන් බැණ වැදුන මනුෂ්‍යයාගේ වාහනයද නවතා ඇති බව දුටුවිට ජෝන් ඉතා පුදුමයට පත්විය. මන්ද එම කාරය පදවාගෙන පැමිණ තිබුණේ එම සභාවට අලුතින් පැමිණි පාලකවරයා වූ නිසාවෙනි. එම අලුත් පාලකවරයා දේව මෙහෙයෙන් පසුව ජෝන්ව මුණගැසුනි. ඔහුගේ මනස එම මොහොතේදී කෙසේ තිබෙන්නට ඇතිද කියා සිතන්න. මෙවැනි කෝපය කිතුණුවන් ජයගත යුතුමයි. එය අපගේ කිතුණු සාක්ෂියට මහත්වූ පලුද්දක් වන ඇත.

## (3). උදහස

උදහස යන කාරණය අපට දෙයාකාරයකින් වෙන්කොට තැබිය හැකිය.

a. ***ධර්මිෂ්ඨවූ උදහස***

b. ***අධර්මිෂ්ඨවූ උදහස***

යේසුස්වහන්සේ උදහසින් යුතුව ක්‍රියාකරනු ලැබුවේය. තම පියාණන්වහන්සේගේ නිවස 'හොර කණ්ඩායමකින්' පිරී තිබූ නිසා උන්වහන්සේ උදහස විය. ***(මතෙව් 21:13)*** උන්වහන්සේ ලණුවලින් කසයක් සාදා සියලුම වෙළඳුන්ට ගසා පන්නා දැමුවේය. නමුත් අපට මෙම ධර්මිශ්ඨවූ කෝපයෙන් ක්‍රියා කල නොහැකිය. මන්ද අපගේ සෑම හැඟීමක්ම පාපය කරණකොටගෙන ඇතිවී තිබේ. අපගේ උදහසද පාපය කරණකොටගෙන ඇතිවී තිබේ. ***''ස්වාමීන්ට ප්‍රේම කරන්නෙනි, නපුරට වෛර කරව්...'' (ගීතාවලිය 97:10) ''භයින් සිටව්, පව් නොකරව්...'' (ගීතාවලිය 4:4)*** පාවුලු තුමා එපීසයේ සභාවට ලියනු ලබන්නේද මෙම පදයමයි. ***''ඉර බසින තුරු නුඹලාගේ කෝපය පවතින්ට ඉඩ නාරිල්ලා. යක්ෂයාට ඉඩ නොදෙල්ලා...'' (එපීස 4:26-27)***

අප ඉතා ප්‍රඥාවන්ත ලෙස උදහස් වීමට ප්‍රමාද වේවා. ***''...මක්නිසාද මනුෂ්‍යයාගේ උදහසින් දෙවියන්වහන්සේගේ ධර්මිශ්ඨකම ඉෂ්ඨ නොවන්නේය.'' (යාකෝබ් 1:19-20)*** මෙහිදී පාවුලු තුමා අපට පවසන්නාවූ කාරණය නම්, අප ලග තිබෙන අනවශ්‍ය සියලු බර ඉවතට දැමිය යුතු බවයි. පළමුකොට අප පවු නොකල යුතුයි. එපීසයේ සභාවට පාවුලු තුමා දුන් පණිවිඩයෙන්ම අපටද පිළිතුරු දෙයි. අප උදහස් වීම සම්බන්ධ ඉතා ප්‍රවේසමින් කටයුතු කල යුතුය. තවද අපගේ උදහස ඉර බැසීමට පෙර අත් හැර එය නිවැරදි කරගත යුතුය. මෙයින් පැහැදිලි කරනු ලබන්නේ අප තුල තිබෙන්නාවූ උදහස දින ගණනක් නොතබවාගෙන එම දවසේදීම එය හරිගස්සා ගත යුතු බවයි. තවද අපගේ උදහසින් ක්‍රියා කරන පිණිස යක්ෂයාට කිසිම අවස්ථාවකදී ඉඩ නොදිය යුතුය. අප උදහස් වෙන්නාවූ සෑම මොහොතකදීම අප යක්ෂයාට ඉඩ දෙමු. සලමොන් රජතුමා මෙසේ ලියයි, ***''මෘදු උත්තරයකින් කෝපය පහවෙයි. එහෙත් කර්කශ වචනයකින් කරහ හටගනියි.'' (හිතෝපදේශ 15:1)*** එනම් ඔබගේ ගමන පහසුවන පිණිස උදහස අත් හරින්න.

## (4). කෝලහාලය

කෝලාහාලය යනු රණ්ඩුවීම, අපව පාලනය කර ගැනීමට නොහැකිව අන් අයට බැණවැදීම යන මෙවැනි දේ අප තුල නොතිබිය යුතුය. බොහෝ අවස්ථාවන් වලදී මෙවැනි කෝලහාලයන් දකිමු. අද බොහෝ ස්ථානවල, සභාවන් තුළ කමිටු රැස්වීම් වලදී, සභාවන් තුල පවත්වන්නාවූ ඡන්ද රැස්වීම් වලදී මෙවැනි කෝලහාලයන් සිදුවන බව අපි දකිමු. පාවුලු තුමා තිමතිට ලියන විටදී මෙසේ ලියනු ලබයි. ***''ඔහු බේබද්දෙක් නොවූ, ගහගන්නෙක් නොවූ, ඉවසිලිවන්තවූ, ඩබරකාරයෙක් නොවූ, වස්තු තෘෂ්ණාව නැත්තාවූ,'' (1 තිමෝති 3:3)*** යන ගුණාංග වලින් යුක්තව දේව සේවකයක්ව සිටිය යුතුය.

තවද සලමොන් රජතුමාද මෙසේ ලියනු ලබයි. ***''ඩබරකාර ස්ත්‍රීයෙකු සමඟ පොදු ගෙයක සිටීමට වඩා පියස්සේ මුල්ලක ඉදීම හොඳය.'' (හිතෝපදේශ 21:9)***

## (5). අපහාස

අපහාස කිරීම යනු අන් අය ගැන කථා කිරීමයි. විශේෂයෙන් අන් අයට විරුද්ධව ඔවුන් නොමැති ස්ථාන වල ඔවුන් ගැන කථා කිරීමයි. අප තවත් කෙනෙකුට අපහාස කරන විටදී එය එම පුද්ගලයාට පමණක් නොව එය අපටද අගෞරවයක් ගෙනෙයි. ***ගණන් කථාව 12:2*** හි මෙසේ පවසයි. මෝසෙස් පාවාගත් කූෂ් ස්ත්‍රීය නිසා මීරියාම් සහ ආරෝන් ඔහුට විරුද්ධව කථාකළෝය. ***''...ස්වාමීන්වහන්සේ ඒක ඇසූසේක.'' (ගණන් කථාව 12:2)*** උන්වහන්සේ මීරියම් සහ ආරෝන් ගැන කෝපවී මෙසේ ඇසුවේය. ***''...එබැවින් නුඹලා මාගේ මෙහෙකරු වූ මෝසෙස්ට විරුද්ධව කථාකරන්ට භයනූණේ කෙසේද?'' (ගණන් කථාව 12:8)*** දෙවියන්වහන්සේගේ උදහස මීරියම් සහ ආරෝන් කෙරෙහි පැමිණුනේය. මීරියම් ලාදුරු රෝගියෙක් විය. අප කථා කරන්නාවූ සෑම වචනයක් ගැනම අප ගණන් දිය යුතු බව දේව වචනයෙහි පවසයි. යේසුස්වහන්සේ මෙසේ පැවසූසේක. ***''එබැවින් නුඹලා අඳුරෙහිදී කී දේ එළියෙහිදී***

GREAT COMMISSION PARTNERS

ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**ජන:19-** නත්තල් දේවමෙහෙය සහ 2023 වර්ෂය ආරම්භක දේවමෙහෙය විශිෂ්ඨ අන්දමින් පැවැත්වීමට හැකිවීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**ජන:20-** ශාන්ත පාවුළු මෙට්‍රිකුලේෂන් විදුහල, නෙහෙමියා බයිබල් විදුහල සහ දේව ධර්ම පාඨමාලාව ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**ජන:21-** පුරුෂයන්ගේ සහභාගීකමට දෙවිඳුන්ගේ ආශිර්වාද ලැබීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**ජන:22-** භාෂා 16 කින් මුද්‍රණය කොට බෙදාහරින කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් මුද්‍රණාලය සේවය ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**ජන:23-** පසුගිය මාසය පුරා සභාවේ ආර්ථික සහ ආත්මික අවශ්‍යතා සපුරාලීම ගැන දෙවිඳුන්ට ස්තුති ප්‍රශංසා කරන්න.

**ජන:24-** පාස්ටර් සෑම් සෙල්වරාජ් ඇතුළු පවුලේ අය වෙත ලැබුන ආශිර්වාද ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**ජන:25-** දේවධර්ම ශාස්ත්‍රාලය අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකිවීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**ජන:26-** යාච්ඤා මැදිහත්කරුවන්, මහා ආඥාවේ මැදිහත්කරුවන් ඇතුළු අනෙක් සේවකයන් සහ ඔවුන්ගේ පවුල්වල අය ආශිර්වාද ලබාගැනීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**ජන:27-** නෙහෙමියා බයිබල් විදුහලේ නේවාසික සිසුන්ට සංගීත පන්තියක් ලැබීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**ජන:28-** ප්‍රධාන සභා සහ ශාඛා සභා වලට නවක ඇදහිලිවතුන් පැමිණීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**ජන:29-** අපගේ සංවිධානයට නවක වෘත්තිය සේවකයන් ලැබීම පිණිස ස්තුති ප්‍රශංසා කරන්න.

**ජන:30-** ශාන්ත පාවුළු මෙට්‍රිකුලේසන් විදුහලට සංගීත පන්තියක් ලබාදීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**ජන:31-** කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවයේ සියලුම සහකාර කතෘවරුන්ගේ පවුලේ අය ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**2023 පෙබරවාරි මාසය**

**පෙබ:01-** නෙහෙමියා බයිබල් විදුහලේ නේවාසික සිසුන්ට සවස් කාලයේ ක්‍රීඩාවේ යෙදීමට කැරම් සහ චෙස් ක්‍රීඩා උපකරණ ලබාදීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**පෙබ:02-** ප්‍රධාන සභාවේ සහ ශාඛා සභාවල සියලුම ඇදහිලිවතුන් ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**පෙබ:03-** රෝහල් සේවය තුළ බලවත් හාස්කම් සිදුවීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**පෙබ:04-** සෑම කිතුණු නිකායටම දෙවියන්වහන්සේගේ ආශිර්වාද සහ ආරක්ෂා ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**පෙබ:05-** මුලු ලෝකයේ සාමය උදෙසා යාච්ඤා කරන්න.

**පෙබ:06-** කාන්තා හිංසනය සහ ළමා අපචාර වලට විරුද්ධව යාච්ඤා කරන්න.

**පෙබ:07-** කැඳවීමේ ප්‍රතිරාවය සම්පූර්ණ සේවය උදෙසා ප්‍රමාණවත් අරමුදල් සපයා ගැනීමට යාච්ඤා කරන්න.

**පෙබ:08-** කැඳවීමේ ප්‍රතිරාවය සම්පූර්ණ සේවයේ සියලුම සියලුම සේවකයන්ගේ නිරෝගි සුවය උදෙසා යාච්ඤා කරන්න.

**පෙබ:09-** දේශයේ සියලුම ජනයන්ගේ එකමුතුවත් දියුණුවත් උදෙසා යාච්ඤා කරන්න.

**පෙබ:10-** කැඳවීමේ ප්‍රතිරාවය සහකාර කතෘවරුන් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් ගැන යාච්ඤා කරන්න.

**පෙබ:11-** පාස්ටර් සෑම් සෙල්වරාජ්ගේ ස්වයං චරිතාපදානය ලියා අවසන් කිරීමට දෙවිඳුන්ගේ ආශිර්වාදය ඉල්ලා යාච්ඤා කරන්න.

**පෙබ:12-** දේව සේවයේ සියලුම අවශ්‍යතා ගැන යාච්ඤා කරන්න.

**පෙබ:13-** දේව රාජ්‍යයේ පොළොවේ තවත් පැතිරවීම ගැන යාච්ඤා කරන්න.

**පෙබ:14-** නොගැලවුන සෙනඟ ජීවත්වන ප්‍රදේශ වෙත සුභාරංචිය යාම ගැන යාච්ඤා කරන්න.

**පෙබ:15-** කැඳවීමේ ප්‍රතිරාවය සංවිධානයේ සියලුම දේව සේවකයන් සහ ඔවුන්ගේ පවුලේ අය ගැන යාච්ඤා කරන්න.

**පෙබ:16-** තරුණ සේවය සහ දුරස්ථ සේවා ගැන යාච්ඤා කරන්න.

**පෙබ:17-** පාස්ටර් සෑම් සෙල්වරාජ් ඇතුළු පවුලේ සැමගේ මනා සෞඛ්‍යය ගැන යාච්ඤා කරන්න.

**පෙබ:18-** මතට ඇබ්බැහිවී සිටින සැවොම පසුතැවිල්ලට පමුණුවන පිනිස යාච්ඤා කරන්න.

4 පිටුවෙන්....

***අසනු ලබන්නේය. ඇතුල් ගෙවලදී නුඹලා කනට කී දේත් ගෙවල් මුදුන්වලදී ප්‍රසිද්ධ කරනු ලබන්නේය.'' (ලූක් 12:3)*** යාකෝබ් 3 වන පරිච්ඡේදයෙහි අපගේ දිව පාලනය කල යුතු බවට දිගු දේශනාවක් දෙනු ලබන්නේ මේ නිසාය. අපහාස කිරීම අපගේ ආත්මික ජීවිතයට අනවශ්‍ය වූ බරකි. මෙවැනි අනවශ්‍ය වූ බර අප ඉවත් කල යුතුමයි.

## (6). ද්වේශය

ද්වේශ කිරීම යනු අප තවත් අයට විරුද්ධව නපුරු දේ කිරීමට, සැලසුම් සහිතව ක්‍රියා කිරීමයි. ***උත්පත්ති 37*** වන පරිච්ඡේදයෙහි මේ සම්බන්ධව අපි හොඳ උදාහරණයක් දකිමු. යෝසෙප්ගේ සහෝදරයන් ඔහුට විරුද්ධ එකතු වී නපුර කිරීමට සැලසුම් කලේය. ***''දැන් වරෙල්ලා, ඔහු මරා වළක දමා චණ්ඩ මෘගයෙක් ඔහු කෑයේයයි කියමුව. එවිට ඔහුගේ ස්වප්න වලට කුමක් වන්නේදැයි බලමු.'' (උත්පත්ති 37:20)*** නමුත් දෙවියන්වහන්සේගේ සැලසුමට අනුව රූබන් තුළින් යෝසෙප්ගේ ජීවිතය බේරුණේය. පසුව දෙවියන්වහන්සේ මිසරයේදී යෝසෙප්ව ඉතා ඉහළ ස්ථානයකට ගෙන ආවේය. යෝසෙප්ගේ සහෝදරයෝ ඔහුට දණගසා වැන්දේය. මෙලෙස හාමාන් මොර්දෙකයිට විරුද්ධව ද්වේශ සහගතව ඔහුව මරණ පිණිස අඩි 70 ක් උස එල්ලුම්ගසක් සෑදුවේය. ***(එස්තර් 5:14)*** නමුත් හාමාන් කළ කුමන්ත්‍රණය ඔහුට විරුද්ධවම හැරුණි. ***(එස්තර් 7:9)***

අප මෙම කරුණු හය දෙස බලන විටදී මේවා අපගේ ජීවිතයේ තිබෙන වැරදි බඩු මලුය. අපට මෙම ගමන ඉදිරියට යාමට හැකි වන්නේ එම බඩු මලු ඉවතට විසි කලහොත් පමණි.

ප්‍රථමකොට අප ගත යුතු පියවර නම්, දෙවියන්වහන්සේ ඉදිරියෙහි අපේ හදවත විමසා බලා අපගේ ජීවිතය තුල ඇති තිත්තකම, කෝපය, උදහස, කෝලහාලය, අපහාසය හා ද්වේශය යන සියල්ලම දෙවියන්වහන්සේගේ අභිමුඛත්වයෙහි තබා මෙම බර ඉවත් කරන්නය කියා උන්වහන්සේගෙන් කරුණාව ඉල්ලිය යුතුය. අප සමඟ යාච්ඤා කරන පිණිස යාච්ඤාවේ සහකරුවෙක් හෝ සහකාරියක් සිටීනම් ඔවුන්වද එකතු කර ගනිමින් දෙවියන්වහන්සේට යාච්ඤා කරමින් අපි ඉදිරියට යමු.

තවද මෙවැනි ක්‍රියාවන් අපගේ බලයෙන් ඉවත්කර ගැනීමට අපට නොහැකිය. මන්ද අප තුල නිතරම යහපත හා නපුර යන දෙකම නිතරම අප තුල ක්‍රියාත්මක වෙයි. මෙවැනි අත්දැකීම් පාවුලු තුමාට තිබූ නිසා ඔහු රෝම 7:24 හි මෙසේ පවසයි. ***''අනේ, මම කාළකණ්ණි මනුෂ්‍යයෙක්ය, මේ මරණයේ ශරීරයෙන් මා මුදන්නේ කවුද?''*** තවද පාවුලු තුමා යේසුස්වහන්සේ තුළින් මෙයට පිළිතුරු ලබාගෙන ඔහු මහත්වූ සහනයක් ලබාගත්තේය. එම නිසා පාවුලු තුමා මෙසේ පවසයි. ***''අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේට ස්තුති කරමි...'' (රෝම 7:25)***

මෙම සියලුම බර ඉවත්කර ස්වාමීන්වහන්සේ සමඟ ඉතාම පහසුවෙන් ගමන් කරන පිණිස අපට දෙවියන්වහන්සේගේ බලය හා අනුග්‍රහය අත්‍යාවශ්‍ය වෙයි. යේසුස්වහන්සේ අප උදෙසා මැදිහත්කම් කරන සේක. දෙවියන්වහන්සේට යාච්ඤා කිරීමට ශුද්ධාත්මයාණන්වහන්සේ අපට සුදුසු වූ වචන මාලාවක් ගෙන දෙයි. උන්වහන්සේ අපගේ යාච්ඤාව අසා එය පිළිතුරු ගෙන දෙයි. මෙම බලාපොරොත්තුව තුලින් අපට කරුණාවේ සිංහාසනයට ළඟාවීමට හැකිය.

සෑම ක්‍රියාවකටම ප්‍රති විරෝධයක් තිබේ. අපගේ ආත්මය තුළත් අප යහපත් දෙයක් කිරීමට යන විටදී ප්‍රතිරෝධී ක්‍රියාවක් තිබේ. නමුත් ශුද්ධවූ පාවුලු තුමා, 'මේ සියලුම අනවශ්‍ය බරට විරුද්ධව ජය ගැනීමට ප්‍රතිවිරෝධි ක්‍රියාවක් අප කල යුතුය' කියා පවසයි. ***''නුඹලා එකිනෙකා කෙරෙහි ගුණවන්තව අනුකම්පා ඇතුව සිට, ක්‍රිස්තුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේ නුඹලාට කමාවුණ ලෙසම නුඹලාත් එකිනෙකාට කමාවෙයල්ලා.'' (එපීස 4:32)***

එසේනම් අප දැන් කල යුත්තේ කුමක්ද? කියාත් අප රැගෙන යා යුත්තේ මොනවාද? කියාත් සොයා බලමු.

## (1). ගුණවන්තකම

අපගේ ජීවිතයේ අප අත්පත් කරගත යුතු වූ ඉතාම වැදගත් ගුණාංගයක් නම් ගුණවන්තකමයි. අපගේ ජීවිතය තුළ මෙම ගුණවන්තකම තිබෙනවා නම්, එය අපගේ ජීවිත සාක්ෂියට ඉතාම බලවත් වූ දෙයකි. එවිට අප අන් අයට සලකන බවත් ඔවුන්ගේ වේදනාවේදී අප ඔවුන්ව සනසන බවත් හා ඔවුන්ගේ අවශ්‍යතාවයේදී අප ඔවුන්ට උදවු උපකාර කරන බවත් ඔවුන් දැන ගනී. ගුණධර්ම යනුවෙන් අදහස් කරනුයේ, යම් පුද්ගලයෙක් තවත් පුද්ගලයෙකුට යහපත කිරීමේ ගතිගුණයයි. ගුණධර්ම යනු දීමේ හදවතකි. ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසිපත් වීමත් මරණයෙන් නැවත නැගිටීමත් කරණකොටගෙන අපට අමරණීය ජීවිතයත් ගැලවීමත් නිදහසත් හා දේව කරුණාවත් ඉතා අධිකව තිබේ. අප දුර්වලයි කියා සිතන විටදී අප ක්‍රිස්තුස්වහන්සේ තුළ ශක්තිමත්ය. එම ගුණවන්තකම කරණකොට ගෙන අපට අන් අයට කමා කිරීමට පුළුවනි.

## (2). අනුකම්පාව

යම් පුද්ගලයෙක් ඉතා අසීරු තත්වයක් තුල වැටී සිටින විටදීත් ඔවුන් වේදනා විදින විටදීත් ඔවුන්ට ඉක්මන් සුවය බලාපොරොත්තු වන මොහොතේදීත් අප ඔවුන් වෙතට

ගොස් ඔවුන්ට උදවු උපකාර කරනවා නම්, එය අනුකම්පාව ලෙස අර්ථ කථනය කල හැකිය. උදාහරණයක් ලෙස අප බස් රථයක් තුළ ගමන් කරන විටදී ගර්භණී මවක් එම රථයට ගොඩවූ විට ඇයට අනුකම්පා කර අප සිටින ආසනයෙන් නැගී සිට ඇයට ඉඳගැනීමට ආසනය ලබා දෙයි. මෙවැනි වූ ඉතා සුළු දේවල් දිනපතාම කරන විටදී අපගේ අශුභවාදී හැඟීම් වලට ශුභවාදී වූ දෙයක් කිරීමට පුළුවනි. අපගේ ජීවිත ගමනේදී අපගේ අවශ්‍යතාවයන් උසුලාගෙන යාමට වඩා එකිනෙකාගේ බර උසුලා ඔවුන්ට උපකාර කරමින් ඔවුන්ට අනුකම්පා කිරීම ඉතාම වැදගත් වෙයි.

යේසුස්වහන්සේ එඬේරෙක් නොමැති බැටළුවන් මහත් සමූහයක් දුටුවේය. ***(මාර්ක් 6:34)*** යේසුස්වහන්සේගේ හදවතට මේ සෙනඟ ගැන අනුකම්පාවක් ඇති විය. උන්වහන්සේ ඔවුන්ගේ ශාරීරික කුසගින්න පමණක් නොව ආත්මික කුසගින්න නිවා දැමුවේය. ***(මාර්ක් 6:37-44)*** දෙවියන්වහන්සේ විසින් සොදොම විනාශ කිරීමට යන බව ආබ්‍රහම් දැනගත් විටදී සොදොම්හි සිටි ධර්මිෂ්ඨවූ සෙනඟ ගැන අනුකම්පා වී ඔහු දෙවියන්වහන්සේට ඔවුන් ගැන යාච්ඤාවෙන් කන්නලව් කලේය. ධර්මිෂ්ඨයින් 50 දෙනෙකු සිටීනම් සොදොම් විනාශ කරනවාද? කියා ඇසුවේය. 50 දෙනෙකු සිටිනවානම් සොදොම විනාශ නොකරන බව දෙවියන්වහන්සේ පැවසුවේය. ආබ්‍රහම් එයින් නොනැවතී සෙනඟ ගැන ඉතා අනුකම්පාවෙන් පිරී 45, 40, 35, 30 ලෙසින් 10 දක්වා අඩු කරමින් මේ සෙනඟ විනාශ නොකරන්නය කියා ඔහු දෙවියන්වහන්සේගෙන් ඉල්ලුවේය. ඔහුගේ මෙම අනුකම්පාවට දෙවියන්වහන්සේ පිළිතුරු දුන්සේක. අපගේ ජීවිතයේද අනුකම්පාව නැමති ගුණාංගය අපගේ ගමනට එකතු කර ගනිමින් ඉදිරියට යමු.

## (3). සමාවදීමේ ආත්මය

ගුණවන්තකම සහ අනුකම්පාව යන ගුණාංගයන් අප තුළ තිබෙනවා නම්, නිතැතින්ම අප අන් අයට සමාවදීමට පටන්ගනිමු. අන් අය සමඟ අපට තිබෙන්නාවූ ශක්තිමත් සම්බන්ධතාවයට, සමාවදීම ඉතාම වැදගත් වෙයි. දෙවියන්වහන්සේ අපගේ වරදට අපට සමාව දී තිබේ. කිතුණු ඇදහිලිවන්තයාගේ ජීවිතයේ කමා කිරීමේ ආත්මය ඉතාම වැදගත් වෙයි. එබැවින් අපද අන් අයට කමාව දිය යුතුය. අපව මනුෂ්‍යයෝ රිදවන විටදී අප සාමාන්‍යයෙන් ක්‍රියා කරන්නේ, තිත්තකම, කෝපය, උදහස, රංඩුවීම, අපහාස කිරීම සහ ද්වේශ කිරීම ආදී දේ තුළින්ය. මෙවැනි දේ තුළින් අප ක්‍රියාකරන විටදී අපගේ මෙම ක්‍රියාවන් තුළින් අන් අය සමඟ තිබෙන සම්බන්ධතාවය විනාශ වන බව අප නොසිතමු. කැඩුණාවූ බිඳුණාවූ සම්බන්ධතාවයන් නැවත ගොඩනැගීමට හැකි වන්නේ, අප තුළ කමා කිරීමේ ආත්මයක් තිබෙන විටදී පමණි. අප ඉගෙනගන්නාවූ සෑම දේම කමා කිරීම යන වචනය තුල අඩංගු වී ඇත.

දෙවියන්වහන්සේ අපගේ පවු වලට කමා කලාක් මෙන්, අපද අන් අයගේ පාප වලට කමා කල යුතු බව පාවුලු තුමා පවසයි. ***(එපීස 1:7)*** මෙම කමා කිරීම අප දෙවියන්වහන්සේ සමඟ තිබෙන්නාවූ සම්බන්ධතාවයේ මධ්‍යස්ථානයක් වනු ඇත. දෙවියන්වහන්සේ අපගේ පාපය මකා දමා උන්වහන්සේගේ උදහස අප වෙතින් ඉවත් කර අධර්මිශ්ඨකමින් මැරී සිටියාවූ අපව උන්වහන්සේගේ අනුකම්පාව කරණකොටගෙන උන්වහන්සේගේ නැවත නැගිටීමේ බලය තුළින් අපට මහිමවත් ජීවිතයක් ක්‍රිස්තුස්වහන්සේ තුළින් දී තිබේ. දෙවියන්වහන්සේ අපට කමාව දී තිබෙන නිසා අන් අපටද කමාව දීමට අපට බලය තිබේ. දෙවියන්වහන්සේ අපගේ පාපය මකා දමමින් ශුද්ධවූ කැළලක් නැති ජීවිතයක් ක්‍රිස්තුස්වහන්සේ තුළින් අපට දී තිබෙන නිසා අපත් අන් අයට කමාකල යුතුමයි. පාවුලු තුමා පවසන්නේ, සෑම දෙනාම දෙවියන්වහන්සේව අනුගමනය කරන ලෙසත් ප්‍රේමයෙන් ජීවිතය ගත කරන ලෙසත් හා ක්‍රිස්තුස්වහන්සේ අපට ප්‍රේම කරමින් උන්වහන්සේගේ ජීවිතය දෙමින් සුවඳ හමන්නාවූ පූජාවක් ඔප්පු කලා කියාය. ***(එපීස 5:1-2)*** අප දෙවියන්වහන්සේව අනුගමනය කරන්නාවූ අය නම්, අප තුළ අන් අයට කමා කිරීමේ ආත්මය ක්‍රියා කරයි.

කමා නොකිරීමේ ආත්මය අපගේ ආත්මික ගමන මග නතර කරයි. අපගේ ඉදිරියට යාමේ ගමන නතර කරයි. කිතුණු ගුණධර්මයේ ලක්ෂණය නම්, කමා කිරීමයි. අප අපගේ පාපයට කමාව ලබා තිබෙන නිසා අප අන් අයට කමා කල යුතුම වෙයි. අපට විරුද්ධව ක්‍රියා කරන්නාවූ අයට කමා කල යුතුයි. අප මේ දේ නොකරනවා නම්, අප සැබෑ කිතුණු භක්තිකයෙක් ඇදහිලිවන්තයෙක් නොවනු ඇත. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කමා කිරීම ගැන මෙසේ පවසයි. ***''මක්නිසාද නුඹලා මනුෂ්‍යයන්ට ඔවුන්ගේ වරද කමාකරන්නහු නම්, නුඹලාගේ ස්වර්ගීයවූ පියාණන්වහන්සේ නුඹලාටත් කමාකරන සේක. නුමුත් නුඹලා මනුෂ්‍යයන්ට ඔවුන්ගේ වරද කමා නොකරන්නහු නම්, නුඹලාගේ පියාණන්වහන්සේවත් නුඹලාගේ වරද කමා නොකරනසේක.'' (මතෙව් 6:14-15) (මාර්ක් 11:15)*** කමාව දී එම වරද අමතක කිරීම ප්‍රීතිමත් කිතුණු ජීවිතයේ රහසකි.

අපගේ ඇස් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි තබා මේ ගමන ඇදහිල්ලේ කර්තෘ වන උන්වහන්සේ දෙසම බලාගෙන යා යුතුයි. ***හෙබ්‍රෙව් 12:1*** හි මෙසේ පවසයි. ***''එබැවින මෙපමණ මහත් සාක්ෂිකාර සේනාවකින් අප වටව සිටින නිසා, සියලු බරද පහසුවෙන් අප අසුකරන පාපයද අහක දමා, ඇදහිල්ලේ කර්තෘවරයාද සම්පූර්ණකරන්නාවූ යේසුස්වහන්සේ දෙසම බලමින්, අප ඉදිරියෙහි තබා තිබෙන දිවීම ඉවසිල්ලෙන් දුවමු.''*** අප යේසුස්වහන්සේ කෙරෙහි බලා සිටිනවා නම්, අපගේ දිවීම අපට කෙළවර කිරීමට පුළුවනි. ධාවන තරඟාවලියෙහි යෙදෙන අය බර ඇඳුමක් ඇඳ දුවන ආකාරයක් අපි නොදකිමු. මන්ද එම බර ඔහුගේ දිවීමේ වේගය අඩපණ කරයි. එම නිසා හෙබ්‍රෙව් කර්තෘ,

*9 වෙනි පිටුවට ...*



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

''...කියවන්නා තේරුම් ගනීවා....'' (මතෙව් 24:15)

## මගේ ජීවිතය ස්වාමින්වහන්සේ වෙනස් කළේය

HE CHANGES MY LIFE!


*''අධිපතීන් සමඟ, එනම් ස්වකීය සෙනඟගේ අධිපතීන් සමඟ, හිඳුවන පිණිස උන්වහන්සේ දුප්පතා ධූලියෙන් නැගුටුවනසේක.'' (ගීතාවලිය 113:7)*

මා රැකියාවක නියුතුව සිටියාවූ දින වලදී මා රැකියාව නිමවී පැමිණෙන විට සෑම දිනකම පත්‍රිකා බෙදමින් පුද්ගලික ශුභාරංචි රැස්වීමේ මාලාවන් ඉතා සුළු ආකාරයෙන් කරගෙන යාමට දෙවියන්වහන්සේ මා හට උපකාර කලේය.




Bro. D.W. Devakanthan

මාගේ ප්‍රිය මිත්‍ර සහෝදර ඩී. ඩබ්ලිව්. දේව කාන්තන් සහ ආර්. ඊ. ජෙයරාජ් මා සමඟ සේවයෙහි නියුතුවූවෝය. 1971 වැනි වර්ෂයේදී දිනක් ඔවුන් පැමිණ මගෙන් මෙලෙස ඇසුවේය, 'ඔබ කාර්යාලයෙහි සිටින විටදී ඔබ ඉතාම පුදුම පුද්ගලයෙක්ව සිටියි. මා ඔබ තුළ විශේෂ දෙයක් දකිනවා. එයට හේතුව කුමක්ද? ඔබ කිතුණුවෙක්ද? යනුවෙනි. මා ඔහුට මෙසේ පැවසුවෙමි. ''ඔව්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ බලය කරණකොටගෙන මා ගැලවීම ලැබූ දරුවෙක්ය'' ''ඔබ හරිම පුදුමයි, තවමත් ඔබ මෙම ගැලවීමේ අත්දැකීම තුලද සිටින්නේ.'' කියා මගෙන් ඔහු ඇසුවේය. මා ඔව් කියා පැවසුවෙමි. ඔහු මාව වැළඳගෙන, සහෝදර දේව කාන්තන් සමඟ ගොස් ඉරුදිනකදී ඔහුගේ පාලකතුමාව හමුවෙන්න පුළුවන්ද කියා ඇසුවෙමි. මා එයට



Chief Pastor G. Sundaram




Assistant Pastor M.K. Sam Sundaram

එකඟවුනෙමි. සහෝදර ඩී. ඩබ්ලිව්. දේවකාන් ඔහුගේ බයිසිකලයේ පිටුපස මාව තබාගෙන 1971 වන වර්ෂයේ දෙසැම්බර් මස අපෝස්තලික ක්‍රිස්තියන් එසෙම්බ්ලි සභාවේ ප්‍රධාන පාළකතුමා වන පාස්ටර් ජී. සුන්දරම් මුණගැනීමට ගියෙමි.

පාස්ටර් ජී. සුන්දරම් සමඟ කථාබස් කලාවූ එම අවස්ථාව මා හට අමතක කිරීමට බැරිය. ඉතා ලස්සන සිනා මුසු මුහුණ, පැහැදිලි වූ කථාව, ඔහුගේ වගකීම යන මේ සියල්ලම මගේ පියාත් සමඟ තිබූ සම්බන්ධතාවය මා හට මතක් කර දුන්නේය. ''මමත් ඔබවගේ වෙන්න ඕන'' කියා මා ඔහුට පැවසුවෙමි. එවිට ඔහු මා වැළඳගෙන මෙසේ පැවසුවේය. ''පුතේ, මේ ඉලක්කයට පැමිණෙන්නට ඕන නම්, ඔබ මහත්වූ මිලයක් ගෙවිය යුතු වෙයි.'' එවිට මා ඔහුට පිළිතුරු දෙමින්, ''මාගේ මුළු හදවතින්ම එය මා ඉටු කරමි.'' කියා පැවසුවෙමි. එදා සිට ඔහුගේ සභාවේ මා ඉතාම ක්‍රියාශීලි සාමාජිකයෙක් හැටියටත් ඔහුගේ සේවා කණ්ඩායමටත් ඇතුලු වුනෙමි.



Bro. Victor Swamidoss




Pr. Sam Selva Raj Ordination - 1977

ඔහුගේ ජීවිත රථාවත්, ඔහුගේ සේවයත් ඔහුගේ දේශනාවත් මාගේ හදවත බොහෝ සෙයින් ඇද බැඳගත්තේය. එසේම ඔහුගේ උප පාලකවරයා වන

පාස්ටර් එම්. කේ. සුන්දරම්ද මාව බොහෝ ආකාරයෙන් සේවය සඳහා පාවිච්චි කලේය. තවද ඔහු මා හට දේව වචනය උගන්වමින් මාව පෝෂණය කලේය. තවද එම සභාවේ සිටි දේව දාසයින් වන, සහෝදර වික්ටර් ස්වාමිදාස්, සහෝදර ඒ. සෙල්ව රාජ්, සහෝදර ජය මෝහන් සහ ඉවැන්ජලිස්ත, ඒ. ජීවානන්දම් යන මේ සෑම දෙනාම ආත්මික ලෙස වර්ධනය වීමට මා හට උපකාර කලේය.







Pr. S.Anand

1972 වර්ෂයේදී පාස්ටර් ජී. සුන්දරම් විසින් මා බෞතීස්මය ලබා 1977 වසරේ දෙසැම්බර් මස 26 වන දින පාස්ටර් එම්. කේ. සුන්දරම් සහ පාස්ටර් රූබන් තිමෝති (දකුණු අප්‍රිකා) ඉදිරියෙහි පාස්ටර් සුන්දරම් විසින් මාව සේවය සඳහා ආලේප කරනු ලැබුවේය. පාස්ටර් සුන්දරම් විසින් තවත් පාලකවරයෙක් වූ පාස්ටර් ආනන්ද යන අප සමඟ එකතු වී සභාවට පැමිණෙන්නාවූ අයගේ සපත්තු සහ සෙරෙප්පු සියල්ල බලාගන්නාවූ වැඩ කොටස් මා හට පැවරුවේය.

ඉන්දියාවෙහි සාමාන්‍යයෙන් දේව මෙහෙයට පැමිණෙන්නාවූ අය පාවහන් ගලවා ඇතුලු වෙයි. ඔවුන් නැවත යන විටදී ඔවුන්ගේ පාවහන් අප භාර දිය යුතුය. මට හා පාස්ටර් ආනන්දට එම රාජකාරිය පැවරී තිබුණි.

අද පාස්ටර් ආනන්ද බලවත් ආත්මික නායකයෙක් සහ කරුණානිදිකලංජි නගරේ යන ස්ථානයේදී චෙන්නෙයි හි තිබෙන අපෝස්තුලු සභාවේ ප්‍රධාන පාලකවරයාය. ඔහු අපගේ නෙහෙමියා බයිබල් විදුහලෙහි ගුරුවරයෙක් ලෙස ඉගැන්වීම් කටයුතු වල යෙදෙන අතර අපගේ සභාවටද පැමිණ නිරතුරුවම දේශනා කරයි. ඔහු මගේ සේවයට බොහෝ උපකාර කර ඇත. මා ඉතා කුඩා සභාවක පාලකවරයෙක් වූ අතර බයිබල් විදුහලක්ද පවත්වාගෙන යාමට උන්වහන්සේ මා හට ඉඩ ප්‍රස්ථාවක් ලබා දී තිබේ.

තවද කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව මාස්පතා බොහෝ භාෂාවන් වලින් මුද්‍රණය කර බෙදා හැරීමට දෙවියන් වහන්සේ මා හට උපකාර කලේය. මා සේවයට ආලේපය ලැබූ විටදී තවත් සභාවන් වලට උදවු කිරීමට මෙන්ම චේපාක් යන ස්ථානයෙහි ඉතා කුඩාවට සභාවක් ආරම්භ වහන්සේ මා හට උපකාර කලේය. මා සේවයට ආලේපය ලැබූ විටදී තවත් සභාවන් වලට උදවු කිරීමට මෙන්ම චේපාක් යන ස්ථානයෙහි ඉතා කුඩාවට සභාවක් ආරම්භ කිරීමටද උන්වහන්සේ උපකාර කලේය. අද මේ පලාතේ උන්වහන්සේට සේවය කරන පිණිස අපටම කියා ස්ථානයක් දී ඇති අතර අප විවිධාකාර සේවාවන් කරමින් යමු.







මා බොහෝ වෙහෙස මහන්සි වී වැඩ කලත් යාච්ඤා කලත් මා හට අලුත් ආත්ම ලැබුනේ නැත. වෙනත් සභාවන් වලට යන්නාවූ අය එකතු කර ගනිමින් ඔවුන්ව මගේ සභාවේ සාමාජිකයින් නොකර ගන්නා බවට මා තීරණයක් ගෙන තිබුණි. බැටළුවන් සොරකම් කිරීමට මා විරුද්ධය. පළමු වසර පහ තුළදී මගේ සභාවේ සාමාජිකයන් වුයේ මගේ බිරිඳත් දුවත් පමණි. සෑම දිනකදීම උදෑසනදී මා ඔවුන්ට දේශනා කරමි. සවසටත් ඔවුන්ට දේශනා කරමි. අප චෙන්නෙයි වල චේපාක් යන ස්ථානයෙහි අක්බාර් සාහිත් වීදියේ සී. එන්. ක්‍රිෂ්ණා ස්වාමි පාරෙහි අපගේ සභාව ආරම්භ කලෙමු. තවද අප වීදි වල දේශනා කලෙමු. රෝහල් වලට ගොස් රෝගීන්ට සේවය කලෙමු. අපට ලැබුණාවූ සියල්ලම අපි දෙවියන්වහන්සේගේ සේවය සඳහා පාවිච්චි කලෙමු.

මා හට එඩෝඩියම් සංගීත භාණ්ඩය වාදනය කිරීමට හැකියාව තිබුණි. මා එය වාදනය කර ගායනා කෙරුවෙමි. මා යේසුස්වහන්සේට ගායනා කරන නිසා එම ගොඩනැගිල්ලේ අයිතිකරු එයට කැමති වූයේ නැත. එම නිසා ඔවුන් මා සිටි නිවසින් යන්නය කියා කරදර කලේය. එම නිසා අප සිටි වීදියේම බොහෝ ස්ථාන වලට මාරුවීමට සිදු විය...

7 පිටුවෙන්....

අපගේ බර නැමති පාපය ඉවත්කර පරණ ගිවිසුමේ සිටි පුරෝගාමී පුද්ගලයින් අපට දැක්වූ ආදර්ශය ගෙන අපගේ දිවීම අප දුවමුය, කියා පවසයි. මෑත කාලයේදී සාදු සුන්දර් සිට, පණ්ඩිත් රාම් බායි, විලියම් කේරි, බිෂොප් අසරියා, ග්‍රැහැම් ස්ටේනස් ආදී බලවත් දේව දාසයින්ද අප ඉදිරියේ මෙම දිවීම ඉතා හොඳින් දිව්වේය. ඔවුන් ඉන්දියානු ජාතීන් උදෙසා සේවය කර අප උදෙසා ඔවුන්ගේ ජීවිතය පූජා කලේය.

2023 වැනි වර්ෂය උදෙසා අප ගන්නාවූ යෝජනාවන් හා තීරණ ගැන අප ඉතා උනන්දු වෙමින් මේ දිවීම නිවැරදිව දුවමු. ශුද්ධවූ පාවුලු තුමා පවසන පරිදි, ''මගේ දිවීම මා කෙළවර කලෙමි.'' එබැවින්, ''*... මෙතැන් පටන් ධර්මිෂ්ඨකමේ ඔටුන්න මට තබා තිබේ, එය ධර්මිෂ්ඨ විනිශ්චයකාරවූ ස්වාමීන්වහන්සේ ඒ දවසේදී මට දෙනවා ඇත. මට පමණක් නොවේ, උන්වහන්සේගේ ප්‍රකාශ වීමට ආශාව සිටින්නාවූ සියල්ලන්ටද දෙනවා ඇත.'' (2 තිමෝති 4:7-8)*

මෙම නව වසර තුළ ඔබගේ යෝජනා හා තීරණ ගැන යාච්ඤා කරන්න. සැහැල්ලු වූ බරක් ඇතිව ගමන් කරන්න. ඔබ සැමට සුභම සුභ 2023 නව වසරක් වේවා.

************

RNI NO. TN/SIH/2006/17846

## Echo of His Call Postal Courses for candidates in India only

**Pray for** BIBLECOR



We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate.**

**There will be no compulsory fees. You will be blessed!**

**The Chairman, Nehemiah Bible College,** Echo of His Call, Post Box 2957, Chepauk, Chennai - 600 005.

Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858, E.mail : biblecor@yahoo.co.in

## කැඳවීමේ ප්‍රතිරාවය

සෑම මසකම භාෂා 16 කින් නිකුත් වන සඟරාව, බයිබල් විද්‍යාලය, තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව, සභා රෝපණය, පාසැල් අධ්‍යාපනික සේවය, සුභාරංචි රැස්වීම් මාලා, සම්මේලනය පැවැත්වීම ආදිය.

| | |
|---|---|
| වාර්ෂික දායකත්වය - රු. 100/- | ජීවිත දායකත්වය - රු. 2000/- |

කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ විවිධාකාර සේවාවන් අප පවත්වාගෙන යනු ලබන්නේ ඔබගේ උපකාරයන් හා ස්වේච්ඡාවෙන් ඔබ දෙන සම්මාදන් හා දීමනා කරණකොටගෙනය. ස්වාමීන්වහන්සේ ඔබට මඟපෙන්වන්නාවූ ආකාරයෙන් කැඳවීමේ ප්‍රතිරාවය සේවයට උපකාර කිරීමට ඔබටද හැකිය. ඔබ දෙන්නාවූ උපකාර කරණකොට ගෙන දෙවියන්වහන්සේව නොදන්නාවූ සෙනඟට සුභාරංචිය ප්‍රකාශ කිරීමට උපකාර වෙනවා ඇත.

ඔබට මෙම සඟරාව අවශ්‍ය නම්, කරුණාකර අපට දන්වා එවන්න. ඔබගේ ඊ-මේල් ලිපිනය හා දුරකථන අංකයද, එසේම ඔබගේ ලිපිනය වෙනස් කරනවා නම් එම වෙනස් වූ ලිපිනයද අපට දන්වා එවන්න.

අපගේ වෙබ් අඩවියට ගොස් මෙම භාෂා 16 කින් ඇති සඟරාවන් බලා ගැනීමට ඔබට හැකිවනු ඇත. ඔබගේ ලිපි, යාච්ඤා ඉල්ලීම් සහ ඔබගේ උපකාරයන් පහත ලිපිනයට අප වෙත එවන්න.

කරුණාකර ඔබගේ දුරකථන අංකය, ජංගම දුරකථන අංකය හා ලිපිනය අප වෙත එවන්න.

**ECHO OF HIS CALL**

10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA

PH: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98412 71858, 98410 71852

E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in

Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**

**Date of Publication: First week of every month**

**Date of Posting : 1st & 2nd of every month**

**Posted at "Egmore RMS / 1 Patrika Channel"**

on 2nd **JANUARY 2023.**

**If un-delivered please return to:**

**ECHO OF HIS CALL (SINHALA)**

P.O. Box No. 2957,

**Chepauk, Chennai - 600 005, INDIA.**

**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

**To**

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**